පුත්තලම නගර සභාව
පුත්තලම දිස්ත්‍රික්කය
--------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 12 දින ද විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 11 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට පුත්තලම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සහා අරමුදලින් ඉදිකල නව කරවල වෙළඳසැලෙහි වටිනාකම වූ රු.846,698 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් මස ගෙවිය යුතු වූ වැටුප් රු.1,947,510ක් ඇතුළුව රු.4,274,898 ක මුදල උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි පවත්වා තිබූ ඉතුරුම් ගිණුම් දෙකකට අදාළ වාර්ෂික පොලී මුදල් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ගෙවිය යුතු දායක මුදල් රු.398,357 ක් ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) වර්ෂයේ විවිධ රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතුව තිබූ ප්‍රාග්ධන ආධාර වටිනාකම් රු.4,532,779 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉකුත් වර්ෂයේ දී ලද ආදායම් රු.54,640 ක් වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබීම නිසා වර්ෂයේ අතිරික්තය අඩුවෙන් ද, කලින් ලද ආදායම් ගිණුම එම වටිනාකමින් වැඩියෙන් ද දක්වා තිබුණි.

(උ) රු.53,000 ක් වූ ට්‍රැක්ටර් අළුත්වැඩියා උපාංග මිලදී ගැනීම සඳහා දරන ලද වියදමක් ජංගම වත්කම් ලෙස දක්වා තිබීමෙන් එම වටිනාකමින් ජංගම වත්කම් වැඩියෙන් ද, වර්ෂයේ වියදම් අඩුවෙන් ද දක්වා තිබුණි.

(ඌ) බැකෝ යන්ත්‍ර සඳහා දරන ලද රු.66,500 ක වියදමක් ආයෝජන ලෙස දක්වා තිබීමෙන් එම වටිනාකමින් වර්ෂයේ වියදම් අඩුවෙන් ද, ජංගම වත්කම් වැඩියෙන් ද දක්වා තිබුණි.

(එ) ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි පවත්වාගෙන යනු ලබන ඉතුරුම් ගිණුම් දෙකක් සඳහා ලද පොලී රු.9,447 ක් ගිණුම්ගත නොකිරීමෙන් එම වටිනාකමින් වර්ෂයේ ආදායම් සහ අදාළ බැංකු ගිණුම් ශේෂ අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) වර්ෂයේ වරිපනම් බදු මත අයකල යුතු රු.2,339,311 ක දඩ මුදල් ගිණුම්ගත නොකිරීමෙන් එම වටිනාකමින් වර්ෂයේ ආදායම් සහ ලැබිය යුතු වරිපනම් බදු අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) බැංකු ජංගම ගිණුම් දෙකක් අතර මාරු කළ රු.950,000 ක මුදල හා රු. 360 ක අත්තිකාරම් ගෙවීමක් කලින් ලද ආදායම් ගිණුමට බැරකර තිබීම නිසා එම ගිණුම රු.950,360 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඕ) 2012 වර්ෂයේ සිව්වන කාර්තුව සඳහා සමාලෝචිත වර්ෂයේ දී ගෙවීම් කල එකතු කල අගය මත බදු රු.884,643 ක් සඳහා එම වර්ෂයේදී වෙන් කිරීම් කර නොතිබුණද, එම මුදල සමාලෝචිත වර්ෂයේදී ගෙවිය යුතු එකතු කල අගය මත බදු ගිණුමට හර කර තිබීම නිසා එම ගිණුම රු. 884,643 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ක) 2012 දෙසැම්බර් මාසය සඳහා සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබු ජාතිය ගොඩනැඟිමේ බදු රු.49,242 ක්, ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු ගිණුමට හර කර තිබුණි. එහෙත් ඉකුත් වර්ෂයේදී ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු ගිණුමට ගෙවිය යුතු වටිනාකමක් ලෙස එම වටිනාකම ගෙන නොතිබීම හේතුවෙන් රු. 49,242 කින් ජංගම වගකීම් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

**--------------------------**

මූලා‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 09 ක එකතුව රු. 154,041,692 ක් වු අතර, උපයෝගී ලේඛණ අනුව අදාල ශේෂයන්ගේ එකතුව රු. 122,538,652 ක් වූයෙන් රු. 42,772,670 ක නොසැසඳුන ශේෂයක් අනාවරණය විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම්**

**-------------------**

වසර ගණනාවක සිට මූලා‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් තිබු අවිනිශ්චිත ගිණුම් 03 ක හර හා බැර ශේෂයන්, පෙර වර්ෂයේ දී එකිනෙකට ගලපා රු.175,949 ක එක් හර ශේෂයක් වශයෙන් දක්වා තිබු අතර, 2013 දෙසැම්බර් 31 දිනට එම ශේෂය ජංගම වත්කම් යටතේ සභාව විසින් කරන ලද තැන්පත් වශයෙන් දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තාවල දිගින් දිගටම වාර්තා කර තිබුණ ද, ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 <u>ලැබිය යුතු ගිණුම්</u>**

2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.122,802,484 ක් වු අතර, එයින් වර්ෂයක කාල සීමාවක් ඉක්මවා තිබු ශේෂවල වටිනාකම රු.107,153,354 ක් විය.

**1.3.5 <u>ගෙවිය යුතු ගිණුම්</u>**

2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබු ගිණුම් ශේෂවල වටිනාකම රු.73,923,885 ක් වු අතර, එයින් වර්ෂයක කාලයක් ඉක්මවා නිරවුල් කර නොතිබු ශේෂවල වටිනාකම රු.57,665,039 ක් විය.

**1.3.6 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම**

**--------------------------------------**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 107,299,033 ක්වු ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**1.3.7 අයවීමට ඇති සේවක ණය**

2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල වටිනාකම රු.1,899,436 ක් වූ අතර, එයින් මියගිය, විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය හා ස්ථාන මාරුවී ගිය සේවකයින් 80 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂවල වටිනාකම රු.183,036 ක් විය. මෙම ණය ශේෂ වසර 10 කටත් වඩා වැඩි කාලයක් තිස්සේ අයනොවී හිඟව තිබූ අතර, එම ණය ශේෂයන් අයකර ගැනීමට කිසිදු උත්සහයක් දරා නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නගර සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,402,624 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,804,547 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (අ) | වරිපනම් හා බදු | 16,536 | 4,538 | 53,929 |
| (ආ) | බදුකුලී | 29,862 | 28,681 | 22,153 |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | 1,185 | 822 | 3,564 |
| (ඈ) | වෙනත් ආදායම් | 15,550 | 18,451 | (2,584) |

**2.2.2 හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට ආදායම් විෂයයන් 4 ක සමුච්චිත හිඟයේ හා ඇස්තමේන්තුගත ආදායමේ එකතුව රු.183,085,000 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම රු.52,492,000 ක් වීම හේතුවෙන් ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය සියයට 29 ක් වැනි පහළ මට්ටමක පැවතුණි.

**2.2.3 මුද්දර ගාස්තු**

2013 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තුවල වටිනාකම රු.919,000 ක් විය. එය 2013 වර්ෂයේ ජූලි මස සිට දෙසැම්බර් මස දක්වා වූ ඇස්තමේන්තුගත වටිනාකම විය.

**2.4** අධිභාර

**--------**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) විගණකාධිපති විසින් 2004 ජුනි 30 දින සභාපති හා ලේකම් වෙත පනවන ලද රු.124,800 ක අධිභාරයක් සඳහා සභාපතිවරයාගේ සහික දීමනාවෙන් මාසිකව රු.3,500 බැගින් අයකරමින් පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසානයටද එම අයකිරීම් නිමකර නොතිබුණි.

(ආ) සභාව විසින් සේවක අර්ථසාධක අරමුදලට අධිභාර වශයෙන් ගෙවා තිබූ රු.360,150 ක් සම්බන්ධයෙන් සභාවේ වගකිවයුතු අයවළුන්ට එරෙහිව ඉදිරියේ දී අධිභාර පියවර ගැනීමට නියමිතව ඇත.

**2.5** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-----------------------------**

වර්ෂය සඳහා වරිපනම් බදු බිල්කිරීම් රු.16,536,296 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පෙර වර්ෂවලින් ඉදිරියට ගෙන ආ හිඟ මුදල රු.62,664,824 ක් විය. සමාලෝචිත වර්ෂය තුලදී බිල්කල වරිපනම් වලින් රු.4,537,925 ක් අයකර තිබූ අතර, හිඟ මුදලින් අයකරගත හැකිව තිබූ ආදායම රු.5,730,469 ක් විය. ඒ අනුව, බිල්කල ආදායම අය කිරීමේ ප්‍රගතිය සියයට 27 ක් වූ අතර, හිඟ මුදලින් අයකල ආදායමේ ප්‍රගතිය සලකා බැලූ විට එය සියයට 10 ක් පමණක් විය.

**2.6** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

**----------------------------------**

**දිගුකාලීන ණය වාරික හිඟ හිටීම**

සභාව මඟින් 2003 හා 2004 වර්ෂවල දී විවිධ සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබූ ණය මුදල් වෙනුවෙන් වාරික හා පොලී නිසි පරිදි ගෙවා නොතිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂයේ අවසානයට රු. 5,217,429 ක ණය වාරික හිඟ හිට තිබුණි.

**2.7** **නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

සභාව සතුව පැවති වටිනාකම රු. 250,000 ක් වූ HCM 99 අත් ට්‍රැක්ටරය වසර 13 ක් ද, රු. 2,104,397 ක් වූ ගිනි නිවීමේ රථය වසර 2 ක් ද, රු. 65,000 ක් වූ වතුර මෝටරය වසර 5 කට වඩා වැඩි කාලයක සිටද නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

2.8 **හඳුනාගත් පාඩු හා හානි**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 1985 සිට 1996 දක්වා වූ කාල සීමාව තුල දී සභා සේවකයකු වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල වෙත ගෙවිය යුතු දායක මුදල් නොගෙවීම මත පනවා තිබූ රු.14,935 ක අධිභාර මුදල් ගෙවා තිබුණි.

(ආ) වර්ෂ 2001 සිට 2007 දක්වා වූ කාලසීමාව තුල දී විවිධ කටයුතු වෙනුවෙන් නිකුත් කල රු.544,838 ක් වූ අත්තිකාරම් ශේෂ 18ක් පියවා ගැනීමට කටයුතු නොකිරීම මත එම වටිනාකම සභා අරමුදලට පාඩුවක්ව තිබුණි.

2.9 **සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලේ අධිභාර**

---

1981 මාර්තු මස සිට 1999 දෙසැම්බර් දක්වා කාලය තුල සභා සේවකයින්ගෙන් අයකර සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට දායක මුදල් නොගෙවීම නිසා ඒ වෙනුවෙන් රු.343,215 ක අධිභාර මුදලක් සභාව විසින් 2009 හා 2010 වර්ෂවල දී කොටස් වශයෙන් සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වෙත ගෙවා තිබුණි. මේ පිළිබඳව මගේ අංක එන්ඩබ්ලිව්/පීටී/ඒ/03/පුත්.න.ස/2011/46 විමසුම මඟින් මෙම පාඩුවට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන වාර්තා කරන ලෙස දන්වා ඇතත් නිශ්චිත පිළිතුරු සැපයීමට සභාව අපොහොසත් වී තිබුණි.

**3. පද්ධති හා පාලන**

---

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර විගණනය
(ඇ) ණයගැති හා ණයහිමි පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය